**විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලය - 2024**

**-----------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 22 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් සඳහා දරණ ලද වියදමින් වත්කමෙහි අගය වැඩිවීමක් සිදුවේ නම් එම අගය ප්‍රාග්ධනිත කල යුතු වුවද ඉන් බැහැරව වෛද්‍ය උපකරණ අළුත්වැඩියා වියදම් රු.4,078,788ක් අයභාර වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය වැඩියෙන් හා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව මෙම උපකරණ අළුත්වැඩියාව පුනාරාවර්තන වියදම් උපයෝගී කරගෙන සිදුකර ඇති අතර ශල්‍යකර්ම බාධාවකින් තොරව සිදු කිරීමටත් අමතර ප්‍රාග්ධන ඉල්ලුම්කර ලබා ගැනීමට කල්ගත වන බැවින් ද මෙම තීරණය ගෙන ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව, සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 215,473,265ක් වූ වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 3 ප්‍රකාරව ඵලදායි ජීව කාලය නැවත සමාලෝචනය කර නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි හා වාහන පිළිවෙලින් 2015 හා 2023 වර්ෂ වලදී ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කලද, අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය සඳහා ජීව විද්‍යා ඉන්ජිනේරු හා තක්සේරු අංශවලට දන්වා ඇතත් ඔවුන් තක්සේරු නොකරන බව දැනුම් දීමෙන් වෛද්‍ය උපකරණ, යන්ත්‍රසුත්‍ර , ලී බඩු, හා සවිකිරීම් , පරිඝණක උපකරණ ප්‍රත්‍යාගණනය කර ගැනීමට නොහැකි විය. | ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මණ්ඩලයේ හිමිකාරීත්වය යටතේ පවතින වාහන 05ක් 2023 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබූ අතර ඉන් රු.මිලියන 8.5ක පිරිවැය වූ වාහනයක් රු.මිලියන 17.7කට අගය කර තිබුණි. මෙම ප්‍රත්‍යාගණිත අගය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කිරීමෙන් තොරව 2024 වර්ෂයේ | එක් වාහනයක අගය ශුන්‍ය නොවීම නිසා 2023 වර්ෂයේ ප්‍රත්‍යාගණිත අගය ගිණුම්වලට ගෙන නැත.2024 වර්ෂයේ ගිණුම්ගතකර ඇත. පෙර වසරේ ගිණුම් ප්‍රතිපත්ති වල සටහන්ව ඇත. | ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

මූල්‍ය ප්‍රකාශණ තුල ප්‍රත්‍යාගණිත අගයට වාර්තා කර තිබුණි. මේ හේතුවෙන් 2024 වර්ෂය ආරම්භයේදී දේපල පිරියත උපකරණ වල වටිනාකම රු.මිලියන 9.2ක් අඩුවෙන් දැක්වුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව සටහන් මඟින් මෙය හෙළිදරව් කර නොතිබුණි.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාවිතයෙන් ඉවත් කරන ලද රු.256,724 ක් වූ ඖෂධවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල නොගැලපීම හේතුවෙන් පාරිභෝජන ද්‍රව්‍ය පිරිවැය හා අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් වෛද්‍ය සැපයීම් ආයතනයෙන් කටයුතු කරගෙන යන අතර රෝහලට ලිඛිතව දැනුම්දුන් පසු එම තිරණය අනුව ගිණුම් ගත කරනු ලැබේ. | භාවිතයෙන් ඉවත් කරන ඖෂධවල වටිනාකම ගිණුම්වලට ගැලපිය යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් රු.60,892,587ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.60,340,465 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම නොවන වගකීම්, පාරිතෝෂික වියදම් හා වර්ෂයේ අලාභය රු.552,122 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වරද 2025 වර්ෂයේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | මෙම රෝහලේ 2024 දෙසැම්බර් 31 දිනට සිදු කල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අතිරික්ත භාණ්ඩ ලෙස හඳුනාගත් Bed Screen 01ක Wall fan 01ක හා Television 01ක හි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම වරද 2025 වර්ෂයේදී ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2018 වර්ෂයේ සිට ලැබිය යුතු සායනික අපද්‍රව්‍ය බැහැර කරන කහ වර්ණයේ පොලිතීන් බෑග් පිටතින් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු.328,771 ක මුදල මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි. එම මුදල සමාගමෙන් අයකර ගන්නා ලෙස 2022 නොවැම්බර් 11 දින පැවති රජයේ ගිණුම් කාරක සභාව විසින්ද නියෝග කර තිබිණි. | මෙය අවසන් ගිණුම් පිළියෙළ කිරීමේදී හඳුනාගෙන නොතිබුණු බැවින් සිසිල් හනාරෝ වෙත ගෙවන බිල්පත් මගින් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව අයකරගැනීම කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආපනශාලාවෙන් 2022 වර්ෂයේ සිට අයකර ගත යුතු රු.95,600 ක කුලිය මෙතෙක් අයකරගැනීමට අපොහොසත් වී තිබුණි. | නීතිමය වශයෙන් කටයුතු කිරීමට පියවර ගෙන ඇත. | මුදල් කඩිනමින් අයකර කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් අනුව කොවිඩ් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම වෙනුවෙන් රෝහල විසින් 2022 වර්ෂයේදී වැයකරන ලද රු.2,249,167ක මුදල ප්‍රතිපූර්ණය කරවා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව කොවිඩ් ව්‍යාපෘති කාර්යාලය සතුව ප්‍රතිපාදන නොමැති බව දැනුම් දී ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශයෙන්ද ප්‍රතිපූර්ණය නොවුණි. රෝහලේ වියදමක් ලෙස කපා හැර ගිණුම් සකස් කිරීමට අනුමැතිය ඉල්ලා සිටියද ඒ සදහා ද අනුමැතිය ලැබී නොමැත. | ප්‍රතිපූර්ණය කර ගැනීමට හෝ අනුමැතිය මත කපා හැරීමට කටයුතු කල යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඖෂධ හා ශල්‍ය වෛද්‍ය උපකරණ සැපයීම වෙනුවෙන් වෛද්‍ය සැපයුම් අංශයට 2024 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු.159,269,184 ක් වන අතර ඉන් රු.105,520,755 ක් අදාළ වනුයේ පසුගිය වර්ෂවලට අදාලව ගෙවියයුතු ශේෂ වේ. | රෝහලට ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවීම නිසා බිල්පත් පියවීමට නොහැකිව ඇත.මේ සම්බන්ධව සෞඛ්‍ය ලේකම්තුමා සමග සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස ප්‍රධාන මූල්‍ය නිළධාරි 1 විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාචිකව දැනුම් දී ඇත. | කඩිනම් විසදුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක PED 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර අත්පොත 3.2.ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටි පිළියෙළ කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවද, 2024 දෙසැම්බර් 31 | රෝහල් අධ්‍යක්ෂ තනතුර සදහා බදවා ගැනීමේ පටිපාටිය සකස් කර කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර අනිකුත් බදවාගැනීම් පටිපාටි සකස් කිරීමට | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දින වන විටත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටි පිළියෙළ කර නොතිබුණි. | සාකච්ඡා කරමින් පවති. | |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වූ වාර්තා තබා ගත යුතු වුවද, මණ්ඩලයේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | වෘත්තීය සමිති ඉල්ලීමද සලකා බලා රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය සවිස්තරාත්මකව සාකච්ඡාකර ඇඟිලි සළකුණු යන්ත්‍රයක් අවශ්‍ය නොවන බව තීරණය කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.46,955,294ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,587,172 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,368,122 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වැටුප් හා වේතන රු.60,719,208 කින් වැඩිවීම සහ සැපයුම් හා පාරිභෝජන වියදම් රු.23,702,283 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත ගෙවිය යුතු රු.30,981,636 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණද මෙම වියදම මණ්ඩලයේ යෝජිත වාට්ටු සංකීර්ණයේ ව්‍යුහාත්මක සැලසුම් ඇඳීම වෙනුවෙන් 2019 වර්ෂයට අදාල වියදමක් විය. වර්තමානය වන විට මූලික සැලසුම ඇඳීමේ කටයුතු හැර අනෙකුත් කිසිදු කාර්යක් සිදු නොකිරීම හේතුවෙන් මෙම වියදම නිශ්කාර්ය වියදමක් වී තිබුණි | මෙය යෝජිත වාට්ටු සංකීර්ණයේ සැලසුම් ඇදීම සඳහා වූ මූලික වියදම වන අතර 2020 වසරේ රජයෙන් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව අත්හිටුවන ලදී. ඉහත කරුණ හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉල්ලීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හිමිව නැත. | වියදම අනාර්ථික නොවීමට කටයුතු කල යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මණ්ඩලයේ මළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගලි සේවාව සඳහා 2024 වර්ෂයේදී පෞද්ගලික සැපයුම්කරුවෙකුට රු.406,500 ක් ගෙවා තිබිණි. සීදූව කටුනායක නගර සභාව මඟින් ගලියක් සඳහා රු.6,000 ක මිලක් යටතේ සේවාව සිදුකර ගත හැකිව වුවද පෞද්ගලික සැපයුම්කරුට ගලියකට රු.8,500 ක් හා රු.10,000 ක් ලෙස ඉහළ රේටයක් යටතේ එම සේවාව සලසා ගැනීම හේතුවෙන් රු.136,500ක මුදලක් වැඩියෙන් ගෙවීමට සිදුව තිබුණි. සේවාව සැපයූ ආයතනය විවිධ වර්ගවල බිල්පත් ඉදිරිපත් කර තිබූ අතර ආයතනය නමින් වූ ලියාපදිංචි අංක සහිත විධිමත් බිල්පත්/ ඉන්වොයිසියක් ඉදිරිපත් කර නොතිබුණි. එම අවිධිමත් බිල්පත් සඳහා මණ්ඩලය විසින් ගෙවීම් සිදු කර තිබීමෙන් නිවැරදි බිල්පත් මත සිදු කළ ගෙවීම් ද යන්න විගණනයට තහවුරු කර ගැනීමට නොහැකි විය. | ශල්‍යකර්ම, සායන සහ බාහිර රෝගී අංශයන් සඳහා පැමිණෙන රෝගීන්ගේ වැඩි වීමක් සමග ගලි වලවල් පිරිසිදු කිරිම ඉතා ඉක්මනින් කළයුතු වේ. නගර සභාව විසින් සපයනු ලබන ගලි බවුසර්වල ධාරිතාවයට වඩා දෙගුණයක් වැඩි ධාරිතාවයකින් යුතු ගලිබවුසර් මෙම සැපයුම්කරු ලබා දේ. | මණ්ඩලයට වාසිදායක වන ක්‍රියාමාර්ග ගැනීම කළ යුතු වේ |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රුධිරයේ සීනි මට්ටමේ ඉතිහාසය (History) පරීක්ෂා කිරීම සඳහා 2021 වර්ෂයේ දී රු.4,800,000කට මිලදී ගෙන රසායනාගාරයේ ස්ථාපිත කරන ලද HbA,C Analyzer යන්ත්‍රයේ පරීක්ෂණ සිදු කිරීමට යෙදිය යුතු ප්‍රතික්‍රියක (Reagent) සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදුවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 06 දින සිට ක්‍රියාත්මක කර නොතිබුණි. එම යන්ත්‍රයේ පිරිවිතර (Specification) අනුව අවම වශයෙන් සතියකට වරක් On/Off කළ යුතු වුවද වර්තමානය වන විට පරීක්ෂණ කටයුතු සඳහා යොදවා නොගැනීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. යන්ත්‍රය | මේ සඳහා Capilary අටක් අළුතින් සවිකළ යුතු බව මෙම යන්ත්‍රය මිලදිගත් ආයතනයෙන් වාචිකව දන්වා ඇත. මින් එකක් රු.250,000 ක් පමණ වන බැවින් ඔවුන්ගේ ලිඛිත නිර්දේශය ලැබුණු පසු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමුකර ක්‍රියා කිරීමට පියවර ගනු ලැබේ. | ප්‍රසම්පාදනයේදී යන්ත්‍ර අළුත්වැඩියා අමතර කොටස් හා පසු සේවාවන්ගේමිල පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතුය. |

දිගුකලක් නිශ්කාර්යව පැවතීම නිසා නැවත ක්‍රියාත්මක කිරීමට Capilary අටක් අළුතින් සවි කිරිමට අවශ්‍ය බව ද එක් ඒකකයක් රු.250,000 ක් බැගින් ඒකක 08 ක් අවශ්‍ය වන බවද අනාවරණය විය. මෙම යන්ත්‍රය මිලදී ගැනීමට පෙර අදාල ප්‍රසම්පාදනයේදී අවශ්‍ය ප්‍රතික්‍රියක මිල පිළිබඳ අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී තිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එන්ඩොස්කොපි ඒකකය මගින් UGIE සහ LGIE පරීක්ෂණ දෙක සිදුකරන අතර ඒ සඳහා මණ්ඩලයේ පූර්ණ කාලීන වෛද්‍යවරයෙකු නොමැතිවීමෙන් එක් වෛද්‍යවරයෙකු විසින් සතියකට එක් දිනක් පමණක් මෙම ඒකකයේ පරීක්ෂණ සිදුකරනු ලබයි. එක් පරීක්ෂණයක් සඳහා රු.4,000 ක පමණ මුදලක් අයකරන අතර 2025 මාර්තු වන විට රෝගීන් 160ක් පමණ පොරොත්තු ලේඛනය තුල සිටීම හේතුවෙන් රෝහලට උපයාගත හැකිව තිබූ ආදායමක් අහිමි වී තිබූ අතර රෝගීන්ගේ පරීක්ෂණ කටයුතුද ප්‍රමාද වී තිබුණි. | රෝහල සඳහා වෛද්‍යවරු පුරප්පිඩුව පවතින අතර මෙම පරික්ෂණ දෙක සඳහාම වෙනම වෛද්‍යවරයකු යෙදවීමට ප්‍රමාණවත් වෛද්‍යවරුන් රෝහල සතුව නැත. එමනිසා සතියට එක් දිනක් පමණක් ඒනඩොස්කොපි කිරීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. | කාර්යක්ෂමව සිදු කිරිමට සුදුසු ක්‍රියා මාර්ගයක් කඩිනමින් ගත යුතුය. |
| (ආ) | විජය කුමාරතුංග අනුස්මරණ ආරෝග්‍යශාලා මණ්ඩලයේ ප්‍රවර්තන වර්ෂයේ ආදායම රු.127,335,336ක් වූ අතර වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා රු.199,311,493ක ප්‍රමාණයක් වැය කර තිබුණි. වර්ෂයේ ලද ආදායම වර්ෂයට අදාල වෛද්‍ය සැපයුම් මිලදී ගැනීම සඳහා ද ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | මහ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා අඩුවීම,අර්ධ රාජය ආයතනයක් නිසා ඖෂධ සැපයුම් අංශයෙන් මුදල් අයකිරීම හා ශල්‍යකර්ම සහ අනෙකුත් පරීයේෂණ සඳහා රෝගීන්ගෙන් අයකරන ගාස්තුව තුලින් ඖෂධ මිලවත් ආවරණය නොවීම. | ආදායම් වැඩිකර ගැනීමට හා වියදම් අවම කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | පිරිසිදු කිරීමේ කටයුතුවල නිරත සේවකයින්ගේ දෛනික පැමිණීමේ ලේඛන පරීක්ෂාවේදී කාන්තාවන් දෙදෙනෙකු එකම අත්සන භාවිතා කරන බව හා එක් අයෙකු නොමැතිනම් අනික් සේවිකාවගේ අත්සනද නොමැති බව දක්නට ලැබුණි. 2025 මාර්තු මස 24 , 25 හා 26 යන දිනයන්හිදී සිදුකළ භෞතික පරීක්ෂාවේදී ව්‍යාජ නම් හා හැඳුනුම්පත් අංක දෙකක් යොදා ගෙවීම් ලබාගෙන ඇති බව තහවුරු විය. ඒ අනුව දෛනික සේවයේ යොදවන සේවකයින්ගේ | මේ සම්බන්ධයෙන් පරික්ෂාකර බලා එසේ අයකර ගැනීමට ඇත්නම් අදළ ආයතනයෙන් ඉදිරි බිල්පත් වලින් අවකරණය කිරීමට කටයුතු කරනු ලැබේ | පරීක්ෂාකර බලා ව්‍යාජ ගෙවීම් අයකරගත යුතුය. |

ලැයිස්තුව සනාථ කිරීමේදී කලමනාකරණය විසින් වැඩි අවධානයක් යොමු කළ යුතු අතර සමාලෝචිත වර්ෂයේ ගෙවීම්වල පැවති ව්‍යාජ නමින් ඇති පුද්ගලයින් හඳුනාගෙන සිදුකර ඇති ගෙවීම් නැවත අදාළ ආයතනයෙන් හෝ වගකිවයුතු පාර්ශ්වයන්ගෙන් අය කරගත යුතු විය.

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 ඖෂධ හා උපාංග ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.4.1 ප්‍රකාරව, හදිසි හා අත්‍යාවශ්‍ය මිලදිගැනීම් අවස්ථාවක හැර තාක්ෂණික ඇගයීම් කමිටුවක සෞඛ්‍ය අමාත්‍යාංශයේ, රාජ්‍ය ඖෂධ සංස්ථාවේ, මහා භාණ්ඩාගාරයේ, වෛද්‍ය පර්යේෂණ ආයතනයේ, වසංගත රෝග විද්‍යා ඒකකයේ නියෝජිතයෙකු සහ අවම විශේෂඥතාවක් සහිත උපදේශකවරුන් දෙදෙනෙකුගෙන් සමන්විත වියයුතු වුවද රෝහල විසින් අවස්ථාගත 22 කදී රු. 34,387,771 ක්වූ ඖෂධ හා උපාංග මිලදී ගැනීමේදී එවැනි නියෝජනයක් සහිත කමිටුවක් පත් කර නොතිබුණි. | ඉතා හදිසි ශල්‍යකර්ම සඳහාත් රෝහලේ ශල්‍යාගාර සේවා අඛණ්ඩව පවත්තාගෙන යෑම සඳහාත් අත්‍යවශ්‍ය ශල්‍ය උපකරණ හා ඖෂධ ලියාපදිංචි සැපයුම්කරුවන් මගින් තිදෙනෙකුගෙන් යුත් තාක්ෂණ ඇගයීම් කමිටුවක් මගින් සිදුකර ගනු ලැබේ. තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව සිදු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල වියයුතුය |